# ඇමෙරිකානු තානාපති කාර්යාලය, කොළඹ

## වඩු කාර්මික අධීක්ෂක (කාන්තා / පුරුෂ)

**කොළඹ පිහිටි ඇමෙරිකානු තානාපති කාර්යාලය විසින් පහසුකම් කළමනාකරණ කාර්යාලයේ පවතින වඩු කාර්මික අධීක්ෂක තනතුර සඳහා සුදුසුකම්ලත් අයදුම්කරුවන් / කාරිණියන් බඳවා ගැනේ.**

**කාන්තා සහ පුරුෂ දෙපාර්ශවයම මෙම තනතුර සඳහා අයදුම් කරනු ඇතැයි අපේක්ෂා කරමු.**
**ඇමෙරිකානු තානාපති කාර්යාලය ජාතිය, වර්ණය, ආගම, ලිංග භේදය, ජාතිකත්ව සම්භවය, වයස, ආබාධිතභාවය, දේශපාලන පක්ෂපාතිත්වය, විවාහක / අවිවාහක බව හෝ ලිංගිකත්ව අභිමතය යන කරුණු නොසලකන අතර මානව විවිධත්ව ශ්‍රම බලකායක් යටතේ සමාන අවස්ථා වෙනුවෙන් කටයුතු කරනු ලබයි.**

මෙම තනතුර දරන්නා වඩු කාර්මික ශිල්පීන් සහ මේසන්වරුන් හය දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමක් අධීක්ෂණය කළ යුතු අතර 2022 වසරේ මුල් භාගයේ විවෘත කිරීමට නියමිත නව තානාපති කාර්යාල පරිශ්‍රයේ ද, ඇමෙරිකානු රජයට අයත් අනෙකුත් ගොඩනැගිලි වල ද සියලුම වඩු වැඩ සහ මේසන් වැඩ නිමා කිරීමට වගබලා ගත යුතුය. වඩු කාර්මික අධීක්ෂක විසින් ගොඩනැගිලි වල නිමාව, ලී වැඩ, දොර ජනෙල් වැඩ, අගුළු හා උපාංග, වහල අලුත්වැඩියාව, රාක්ක සෑදීම, මේසන් අලුත්වැඩියා කටයුතු, ගෘහ භාණ්ඩ සවි කිරීම සහ අනෙකුත් අදාළ රාජකාරීන් ඉටු කළ යුතුය.

**පූර්ණ කාලීනව සතියකට පැය 40 ක සේවා කාලයක් සහිත මෙම තනතුර සඳහා මාසික දළ වැටුප රු. 92,826/- කි.**

### අවශ්‍ය සුදුසුකම් :

1 **අධ්‍යාපනය** - අ. පො. ස. සාමාන්‍ය පෙළින් පසුව ගොඩනැගිලි සේවාවන් වලට අදාළ වඩු කාර්මික ශිල්පය, ලී වැඩ, සවි කිරීම් සහ නඩත්තු කටයුතු පිළිබඳ අවම වශයෙන් වසරක පුහුණු ශිල්පී මට්ටමේ වෘත්තීය හෝ ආධුනිකත්ව පුහුණුවක් ශ්‍රී ලංකා වෘත්තීය පුහුණු ආයතනයේ හෝ අධ්‍යාපන අමාත්‍යාංශයේ අනුමැතිය ලත් පිළිගත් ආයතනයකින් සම්පූර්ණ කර තිබිය යුතුය. **(අදාළ අධ්‍යාපන සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

2 **පූර්ව රැකියා පළපුරුද්ද** - වඩු කාර්මික ශිල්පය, ලී වැඩ, සවි කිරීම් ආදී ගොඩනැගිලි සේවාවන් සහ නඩත්තු කටයුතු පිළිබඳ අවම වශයෙන් වසර 5ක පළපුරුද්දක් තිබිය යුතු අතර ඉන් අවම වශයෙන් වසරක කාලයක් අධීක්ෂක තනතුරක සේවය කර තිබිය යුතුය. **(අදාළ සේවා / ආයතනයේ පළපුරුද්ද පිළිබඳ සහතිකවල පිටපත් අමුණා එවිය යුතුය).**

3. **භාෂා ප්‍රවීණතාවය** - **III** වන මට්ටමේ (මනා කාර්යක්ෂම දැනුම) ඉංග්‍රීසි භාෂාව කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ. **(මෙය පරීක්ෂා කරනු ලැබේ).**
එසේම, **III** වන මට්ටමේ (මනා කාර්යක්ෂම දැනුම) සිංහල හෝ දෙමළ කියවීම, ලිවීම සහ කථා කිරීමේ නිපුණතාවය අවශ්‍ය වේ.

4 **නිපුණතා සහ හැකියාවන්** - සියලුම වඩු උපකරණ, යන්ත්‍ර සූත්‍ර සහ පරීක්ෂණ උපකරණ පිළිබඳ මනා දැනුමක් තිබිය යුතුය. මනා රිය ධාවන වාර්තාවක් සහිතව **"B"** පන්තියේ වලංගු රියදුරු බලපත්‍රයක් (කලින් **'C'**,**'C1'** කාණ්ඩ) තිබිය යුතුය.
**( රියදුරු බලපත්‍රයේ පිටපතක් අමුණා එවිය යුතුය. )**

### අවශ්‍ය ලේඛන :

මෙම තනතුර සඳහා අයදුම් කිරීමට, අයදුම්කරුවන් විසින් **විද්‍යුත් අයදුම්පත සමඟ පහත ලේඛනවල විද්‍යුත් පිටපත් ඉදිරිපත් කළ යුතු ය**. එසේ කිරීමට අපොහොසත් වන අයදුම්කරුවන් මෙම රැකියා අවස්ථාව සඳහා සුදුස්සන් නොවන බවට සලකනු ලැබේ.

- අදාළ අධ්‍යාපන සහතික
- අදාළ සේවා / කාර්යය පළපුරුද්ද පිළිබඳ සහතික
- රියදුරු බලපත්‍රය (පැති දෙකම සහිත)
- පුරවැසිභාවය සනාථ කිරීමේ ලියවිලි (ජාතික හැඳුනුම් පත / විදේශ ගමන් බලපත්‍රය සහ/හෝ වැඩ බලපත්‍ර)

### අයදුම් කරන ආකාරය :

ඔබගේ අයදුම්පත ඉලෙක්ට්‍රොනික බඳවාගැනීමේ යෙදවුම් පද්ධතිය **[ERA]** හරහා ඉදිරිපත් කිරීම සඳහා කරුණාකර අපගේ වෙබ් අඩවිය වන **https://lk.usembassy.gov/embassy/jobs/** වෙත පිවිසෙන්න. ඔබ විසින් අදාළ අයදුම්පත් ඉදිරිපත් කිරීමට පෙර අපගේ වෙබ් අඩවියේ සඳහන් කර ඇති උපදෙස් පරික්ෂාකාරීව කියවනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**තැපැල් හෝ විද්‍යුත් මාධ්‍ය මගින් එවනු ලබන අයදුම්පත් භාරගනු නොලැබේ.**

ඔබගේ අයදුම්පත 2021 **සැප්තැම්බර්** 3 වන දින හෝ ඊට පෙර අප වෙත ලැබෙන්නට සලස්වන්න.
තෝරාගනු ලබන අයදුම්කරුවන් පමණක් කැඳවන බව කාරුණිකව සළකන්න.